වාරියපොල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව වාරියපොල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වාරියපොල ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). කොන්ක්‍රීට් හා බ්ලොක් ගල් ව්‍යාපෘතියේ මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කිරීමේදී ආරම්භක නිමි තොගය රු.609,017 ක් ලෙස ගෙන පැවතියද නිෂ්පාදන වාර්තාව අනුව එකී තොගයේ වටිනාකම රු.735,015 ක් වීමෙන් ව්‍යාපෘතියේ ලාභය රු.125,998 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස මිළදී ගෙන තිබූ රු.238,445 ක් වටිනා වතුර බවුසරයේ වටිනාකම සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,223,784 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,226,467 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,952,437 ක් විය.

### 2.2 <u>මූල්‍ය පාලනය</u>

ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන්ගෙන් ලබාගත් පරිත්‍යාග මුදල් ප්‍රාදේශීය සභා පොදු අරමුදලට නොගෙන තැන්පතු යටතේ ගෙන තිබූ අතර එසේ ලබාගත් මුදල් වලින් විවිධ පොදු හා සුභසාධන කටයුතු සඳහා අවස්ථා 9 කදී රු.748,460 ක් වැයකර තිබුණි. එමෙන්ම ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම් මත සංවර්ධන ආධාර ලෙස 2010 හා 2011 වර්ෂ වලදී ලබාගත් රු.2,500,000 ක් ආදායමට අයනොගෙන තැන්පතු යටතට ගෙන තිබුණි.

### 2.3 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 3,544 | 3,291 | 1,000 |
| (ii) | බදුකුලී | 8,260 | 8,302 | 141 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,330 | 1,356 | 47 |
| (iv) | වෙනත් ආදායම් | 71,318 | 62,336 | 68,315 |

#### 2.3.2 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

සභාව විසින් ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බිල් කිරීම් වලට අදාලව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 හා 67 දක්වා ඇති විධිවිධාන පරිදි වූ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.254,750 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.68,000,000 ක් විය.

2.4 අවිධිමත් ගණුදෙනු

2012 අගෝස්තු 09 දින සිට 16 දින දක්වා වූ වියට්නාම සංචාරය සඳහා වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජුලි 25 දිනැති අංක GGRC/21/30 දරන ලිපිය අනුව අනියම් දීමනා ලෙස දිනකට ඇ.එ.ජ.ඩොලර් 30 ක් ගෙවීමට යටත්ව දින 7ක් සඳහා එක් අයෙකුට ගෙවිය හැකි මුදල රු.27,930(133x30x7) ක් වුවද එම සංචාරයෙ නිරත වූ සභාවේ නිලධාරින් දෙදෙනාට අනියම් දීමනා ලෙස රු.50,000 බැගින් සභා අරමුදලින් රු.100,000 ක් ගෙවා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 203 රීතිය ප්‍රකාරව සභාවේ දේපල පිළිබඳ පූර්ණ සමීක්ෂණ කිරීම සඳහා සභාවේ නියෝජිතයකු, සභාවේ නිලධාරියකු හා පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරියකු යන අයගෙන් සමන්විත මණ්ඩලයක් මගින් වියයුතු බව දැක්වුවත් 2011 සමීක්ෂණය සභාවේ නිලධාරින් පිරිසක් විසින් සිදුකර තිබුණි. එමෙන්ම සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ඉවත් කිරීමට නිර්දේශව පැවති රු.251,150 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය අවසානයට පොත් වලින් ඉවත්කර නොතිබුණි.

2.6 මානව සම්පත් කළමනාකරණය

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 91 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට තත්‍ය සේවක සංඛ්‍යාව 82 ක් විය. මීට අමතරව අනියම්, ආදේශක පදනම යටතේ සේවකයන් 58 කු බඳවාගෙන සේවයේ යොදවා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් ප්‍රතිපූරණ නොලබන සුළු සේවකයන් 29 දෙනෙකු සභාවට අනුයුක්තව පැවතුණි. ඒ සඳහා දළ වශයෙන් සමාලෝචිත වර්ෂය තුල සභා අරමුදලින් රු.11,839,663 ක් පමණ වැයකර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාලව අනුමත ආදායම් පරිපාලක තනතුරු 02 කද, අනුමත පුස්තකාලාධිපති තනතුරු 4 න් 1 ක්ද පුරප්පාඩුව පැවතුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පළාත් පාලන විශ්‍රාම වැටප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,007,580 ව තිබුණි.

එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු…7,976 බැගින් එකී අරමුදල විසන් අයකර පැවතියද, එකී අයකිරීම් සභාවේ කුමන සෙවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ආ). වාරියපොල නගරයේ සුළු පරිමාන වෙළද සංකීර්ණයේ ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී එකවර ගෙවන මුදල් ක්‍රමයට ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල තාක්ෂණික වාර්තා ලබාගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් අයවිය යුතු රු.7,082,650 ක එකවර ගෙවන මුදල් ලබාගැනීම අත්හිටුවා තිබුණි.

(ඇ). සභා බල ප්‍රදේශය තුල වාහන නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් පැවතියද, ඉන් ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචිය හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් සිදුව නොපැවතුණි.

(ඈ). වසර කිහිපයකට පෙර පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලැබී තිබු අංක 27 ශ්‍රී 840 දරණ කැන්ටර් රථය සභාවට නීත්‍යානුකූලව පවරාගෙන නොතිබූ අතර එකී වාහනය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගැනීමක්ද සිදුව නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) මානව සම්පත් කළමනාකරණය